# බ / ධර්මදූත විද්‍යාලය - බදුල්ල
# දෙවන වාර පරීක්ෂණය - 2018
## ගණිතය

9 ශ්‍රේණිය      කාලය - පැය 02යි

### 1 කොටස

- **සියළුම ප්‍රශ්න සඳහා මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න. ( එක් ප්‍රශ්නයකට ලකුණු දෙකක් හිමිවේ.)**

(1) පහත දැක්වෙන සංඛ්‍යා රටාවේ ඊළඟ පද දෙක ලියන්න.

**12 , 19 , 26 , 33 ,** .......................... , .........................

(2) පැත්තක දිග 7 cm වූ ඝණකාකාර ටැංකියක ජල ධාරිතාවය සොයන්න.

(3) $1101_{\text{දෙක}}$ යන සංඛ්‍යාව දහයේ පාදයේ සංඛ්‍යාවක් ලෙස ලියා දැක් වූ විට,

a. 16   b. 18   c. 13   d. 10

(4) සුළු කරන්න

$$\frac{1}{4} \times 3\frac{1}{3} \div 2\frac{1}{6}$$

www.mathsland.org

(5) නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.

| A | B |
|---|---|
| | $x^2 - 6x - 9$ |
| ( - 3 ) ( - 3 ) | $x^2 + 6x + 9$ |
| | $x^2 + 6x - 9$ |
| | $x^2 - 6x + 9$ |

(6) y හි අගය සොයන්න.

$$\frac{y+10}{4} - 12$$

( 7 )




ACD = ECB වේ නම්, ACB සමාන කෝණ දෙකක් නම් කරන්න.

( 8 ) පහත දැක්වෙන ගණනය, ගණක යන්ත්‍රය භාවිතයෙන් සිදුකරන ආකාරය ගැලීම් සටහනක දක්වන්න.

5.78 x 8%

www.mathsland.org

( 9 ) පහත දැක්වෙන සංඛ්‍යා වටයන්න.

I. 1099 ( ආසන්න 10ට ) -

II. 38.39 ( ආසන්න පූර්ණ සංඛ්‍යාවට ) -

( 10 ) අගය සොයන්න.

$\{(2^5)^0\}^{12}$

( 11 )




ඉහත දක්වා ඇති රූපයෙහි CDE = $36^0$ නම්ABC හි අගය සොයන්න.

( 12 ) සාධක දැනුම භාවිතයෙන් අගය සොයන්න.

I. $(105^2 - 5^2)$

( 13 ) එක් පාවහන් යුගලයක මිල රු. 1500 වන පාවහන් යුගල් දෙකක් මිලට ගැනීමේදී 5% ක වට්ටමක් ලබා දෙයි. නිමල් පාවහන් යුගල් දෙකක් මිලට ගනී නම් ඔහු ගෙවිය යුතු මුදල කීයද?

( 14 ) T = $a + (n-1)d$ සමීකරණයෙහි d උක්ත කරන්න.

( 15 )




www.mathsland.org

BC = 24 cm සහ AB = 15cm නම් ADC ත්‍රිකෝණයෙහි ලම්බ උස සොයන්න.

( 16 ) එක්තරා දුම්රියක් පැය හතරක කාලයක් තුළ 480km ක දුරක් ගමන් කරයි. එම දුම්රිය 600kmක දුරක් ගමන් කිරීමට ගත වන කාලය සොයන්න.

( 17 ) එක්තරා සරල රේඛීය ප්‍රස්තාරයක සමීකරණය y = -2$x$ + 8වේ. එම රේඛාවට සමාන්තර වුවද, ( 0 , -3 ) ලක්ෂය හරහා යන්නා වූ ද සරල රේඛීය ප්‍රස්ථාරයේ සමීකරණය ලියන්න.

( 18 ) පහත දැක්වෙන තල රූපය, ත්‍රිකෝණයකින් හා අර්ධ වෘතයකින් සැකසී ඇත. එහි පරිමිතිය සොයන්න.




(19) $x$ හි අගය සොයන්න. ( රූපයේ දී ඇති තොරතුරු භාවිතයෙන් )




(20) එක්තරා නිවසක් හා ගොවිපලක් අතර පරතරය 50cm කි. නිවසට 30 cm ක්ද ගොවිපලට 20cm ක් ද දුරින් පිහිටන පරිදි ළිඳක් කැපීමට තීරණය කරයි. ළිඳ කැපිය යුතු ස්ථානය දැක්වෙන දළ සටහනක් ඇඳ අදාල මිනුම් දක්වන්න.

x — නිවස

x — ගොවිපළ

**11 කොටස**

- **ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න.**
- **A කොටසින් ප්‍රශ්න තුනකටත් B කොටසින් ප්‍රශ්න තුනකටත් වන පරිදි**
- **එක් ප්‍රශ්නයකට ලකුණු 10ක් හිමි වේ.**
- **පිළිතුරු ලිවීම සඳහා වෙනම කොළයක් භාවිතා කරන්න.**

**A කොටස**

( 01 )

a) පියා තමා සතු රු.582 000 ක මුදලින් $\frac{1}{3}$ ක් පුතුට ද ඉතිරිය දියණියට ද බෙදා දෙන ලදී. දියණියට ලැබුණු මුදල සොයන්න.

b) සුළු කරන්න.

$\left(1\frac{2}{5} \div 2\ \frac{1}{3}\right)$ න් $\left(1 + \frac{1}{3}\right)$

c) විමුක්ති රු. 80 000ක් වටිනා අල්මාරියෙක් මිලට ගනියි. ඔහු එහි විකුණුම් මිල රු. 100 000ක් ලෙස සටහන් කර විකිණීමට තබයි. නමුත් ඔහුට එය විකිණීමට හැකි වූයේ 10% ක වට්ටමක් දීමෙන් පසුවය

I. විමුක්ති අල්මාරිය විකුණු මිල කීයද?

II. ඔහුට ලැබුණේ ලාභයක් ද අලාභයක් ද?

III. විමුක්ති ලද ලාභ / අලාභ ප්‍රතිශතය කීයද?

www.mathsland.org

( 2x5=10)

( 02 )

a) $x = 2$ විට, $(x-3)(x-2) = x^2 - 5x + 6$ යන සමීකරණය සත්‍යය බව පෙන්වන්න.

b) $(x-4)^2$ ප්‍රසාරණය කර සරලම ආකාරයෙන් ලියන්න.

c) සාධක සොයන්න.

I. $6a^2b - 9bc$

II. $y^2 + 2y - 15$

III. $16 - 4m^2$

( 2x5=10)

( 03 )

a) දර්ශක දැනුම භාවිතයෙන් සුළු කරන්න.

1. $\frac{(4p^2)^3}{(2p^2q)^2}$

11. $(x^0)^8 \times x^{-2}$

( 2x1=2 )

b) දර්ශක දැනුම භාවිතයෙන් අගය සොයන්න.

1. $\frac{2^3 \times 2^{-2}}{2}$

11. $\frac{2^{-2} \times 4}{8}$

c) විසඳන්න.

1. $\frac{5X-6}{2} = 7$

11. $3m + 4n = 4$
$3m - 2n = 16$

( 2x4=8)

( 04 ) අරය 14m සහ 7m වන අර්ධ වෘත්තාකාර කොටස් දෙකක් ඒක කේන්ද්‍රීය වන පරිදි සම්බන්ධකර පිහිනුම් තටාකයක් සකස් කර ඇත. ( කේන්ද්‍ර දෙපස අර්ධ වෘත්ත පිහිටන පරිදි ) එම පිහිනුම් තටාකය වටා තහඩු පටියක් සවි කිරීමට අවශ්‍යව ඇත. මේ සඳහා අවශ්‍යව ඇති තහඩු පටියේ අවම දිග සොයන්න.

( ලකුණු 10 )



11කොටස

( 05 )

( $a$ )

ඉහත දක්වා ඇත්තේ සරඹ සන්දර්ශනයකට ළමුන් සකසා තිබූ ආකාරයේ මුල් කොටසයි.රටාව වෙනස් නොවන පරිදි ඉතිරි කොටස ද සකසා තිබුණි.

I. මෙහි දැක්වෙන සංඛ්‍යාරටාවේ පළමු පද හතර ලියා දක්වන්න. ( 2 x 1=2)

II. එම සංඛ්‍යා රටාවේ n වන පදය ලියා දක්වන්න. ( 2 x 1=2)

III. මෙහි අවසාන සැකසුම ( පදය ) සඳහා ළමුන් 31 අවශ්‍ය විය. මෙහි සැකසුම් ( පද ) කීයක් තිබේද? ( 3 x 1=3)

( b ) ගැළපෙන සංඛ්‍යාව තෝරා යා කරන්න.

| | **A** | **B** |
|---|---|---|
| I. | $5_{දහය}$ | $1001_{දෙක}$ |
| II. | $110_{දෙක} + 11_{දෙක}$ | $10_{දෙක}$ |
| III. | $101_{දෙක} - 11_{දෙක}$ | $101_{දෙක}$ |

( 1x3=3)

( 06 ) cm / mm පරිමාණයේ සරළ දාරය හා කවකටුව පමණක් භාවිතා කරමින් නිර්මාණ රේඛා පැහැදිලිව දැක්වමින් පහත නිර්මාණය අඳින්න.

I. 8cm දිග සරල රේඛාවක් ඇඳ එය AB ලෙස නම් කරන්න. ( ල. 2යි )

II. B හිදී ABC = $45^0$ වන පරිදී ද A හිදී BAC = $60^0$ වන පරිදි ABC ත්‍රිකෝණ නිර්මාණය කරන්න. ( ල. 2යි )

III. A හා B ලක්ෂ දෙකට සමදුරින් පිහිටි ලක්ෂයේ පථය නිර්මාණය කරන්න. ( ල. 3යි )

IV. B හා C ලක්ෂ දෙකට සම දුරින් පිහිටි ලක්ෂයේ පථය නිර්මාණය කර (iii ) සහ ( iv) හි පථවල ඡේදන ලක්ෂය O ලෙස නම් කරන්න. ( ල.3යි )

( 07 )

www.mathsland.org




ඉහත රූපයේ දී ඇති තොරතුරු අනුව, සලකමින් ඇතුළත් සමීකරණ ගොඩනගන්න

I. ABC ත්‍රිකෝණය සලකමින් m ඇතුළත් සමීකරණයක් ගොඩනගන්න. ( ල. 2යි )

II. m හි අගය සොයන්න. ( ල. 3යි )

III. ABC ත්‍රිකෝණ පාද අනුව වර්ගීකරණයේ දී කුමන වර්ගයට අයත් වේද? ( ල. 2යි )

IV. n හි විශාලත්වය සොයන්න. ( ල. 3යි )

( 08 )

( $a$)




www.mathsland.org

I. m , n , l කෝණ වල විශාලත්වයන් වෙන වෙනම සොයන්න. ( 2 x 3 =6)

II. EFG යනු කෝණ සැලකීමේ දී කුමන වර්ගයේ කෝණයක් ද?

III. GF = 6cm , GE = 8 cm ද නම් EF හි දිග සොයන්න.

( b ) ABCD චතුරස්‍රයකි, AD = AC , BC = AC , AB = BC සහ AD=CD වේ.
ABCD රොම්බසයක් බව පෙන්වන්න.

( 4 x 1 = 4 )




